සියලුම හිමිකම් ඇවිරිණිAll Rights Reserved

**Royal College - Colombo 07**

රාජකීය විද්‍යාලය - කොළඹ 07

33 | S | I

**Grade 10 – Second Term Test – October 2023**

කාලය : පැය 1
Time: 1 hours

දෙවන වාර පරීක්ෂණය – 2023 – ඔක්තෝබර් - 10 ශ්‍රේණිය

# ඉතිහාසය - I

Name: - ............................................................ class: -................. Index no: - ......................

**සැලකිය යුතුයි.**
- සියලුම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිලිතුර තෝරන්න.
- ඔබට සපයන පිළිතුරු පතුයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

1. ශ්‍රී ලංකාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතර පැරණිතම කෘතිය වන්නේ,
   1. මහාවංශය 2. ථූපවංශය 3. දීපවංශය 4. පූජාවලිය

2. පහත සඳහන් ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
   1. ශ්‍රී ලංකාවේ ඉතිහාසය අඛණ්ඩව ලියවුණු ග්‍රන්ථය වන්නේ මහාවංශයයි.
   2. මහාවංශය තුළ ඓතිහාසික පුවත් කෙටියෙන් දක්වා ඇති අතර පුනරුක්ති දෝෂයෙන් යුක්ත වේ.
   3. මහාවංශයේ මුල් කොටස හා දීපවංශයේ ඇතැම් තොරතුරු අතර සමානතාවයක් දක්නට ලැබේ.
   4. මහාවංශ මුල්කෘතිය දික්සඳ පිරිවෙනේ විසූ මහානාම හිමියන් රචනා කරන ලදී.

3. රජරට ශිෂ්ටාචාර සමයේ ඉතිහාසය හැදෑරීමට වැදගත් වන ග්‍රන්ථයකි.
   1. සද්ධර්මාලංකාරය 2. පැරකුම්බා සිරිත 3. රාජාවලිය 4. ඉංග්‍රීසි හටන

4. ආදී කාලීන හෝමෝසාපියන් මානවයාගේ ප්‍රධාන යැපීම් ක්‍රමය වූයේ,
   1. වනයෙන් ආහාර ද්‍රව්‍ය එක්රැස් කිරීමයි. 2. දඩයම් කිරීම සහ වගාකටයුතුවල නිරත වීම.
   3. සතුන් දඩයම් කර ආහාර සපයා ගැනීමයි. 4. දඩයම් කිරීම හා ආහාර ද්‍රව්‍ය එක් රැස් කිරීම.

5. ප්‍රාග් ඓතිහාසික යුගයේ තොරතුරු හමුවන ඉරණමඩු සැකැස්මට අයත් ප්‍රදේශයක් වන්නේ,
   1. බටදොඹලෙන 2. අලිගල 3. පතිරාජවෙල 4. පාහියන්ගල

6. ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික යුගය ලෙස සැලකෙන්නේ,
   1. ක්‍රි.පූ. 7000 – 4500ත් අතර කාලවකවානුව
   2. ක්‍රි.පූ. 450 – ක්‍රි.ව. 300 අතර කාලපරිච්ඡේදය
   3. ක්‍රි.පූ. 600 – ක්‍රි.ව 1100 දක්වා කාලය
   4. වසර 125 000 ක සිට ක්‍රි.පූ. 1800 දක්වා කාල පරිච්ඡේදය

7. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ස්ථාන පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
   1. බටදොඹලෙන, මාතොට, උඩමළල 2. පාහියන්ගල, කුරුණෑගල, දඹදෙනිය
   3. යාපහුව, කෝට්ටේ, දඹදෙනිය 4. බෙල්ලන්බැඳිපැලැස්ස, ගම්පොළ, උඩරංචාමඩම

| "අ" | "ආ" |
|---|---|
| 1. මණිකාරගාම | A - ගොවියන් විසූ ගම |
| 2. ගෝපාලගාම | B - වඩුවන් විසූ ගම |
| 3. කසිකාරගාම | C - මැණික් ගැරූ අය විසූ ගම |
| 4. වඩ්ඪකිගාම | D - ගොපල්ලන් විසූ ගම |

8. ඉහත "අ" කොටසේ දක්වා ඇති වෘත්තිකයන් විසූ පැරණි ගම් "ආ" කොටස සමඟ නිවැරදිව ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,
   1. CDAB   2. CADB   3. CBAD   4. BCAD

9. පුරාණ බ්‍රාහ්මී සෙල්ලිපියක "පුරකමත" යනුවෙන් සඳහන්කර තිබුණේ,
   1. නගරයේ උද්‍යානයක් ගැනයි.   2. නාගරික ආරක්ෂකයා ගැනයි.
   3. නාගරික ප්‍රධාන වාස්තු ශිල්පියා ගැනයි.   3. නගරයේ කෙත්යායක් ගැනයි.

10. "නුරුපුර" ලෙස අනුරාධපුර නගරය හඳුන්වා දී තිබූ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වන්නේ,
   1. ගල්පොත ශිලා ලිපිය   2. පනාකඩුව තඹ සන්නස
   3. වල්ලිපුරම් රන්පත   4. මිහින්තලා සෙල්ලිපිය

11. පූර්ව රාජ්‍ය සමයේ මෙරට පාලනයේ ස්වරූපය හා සම්බන්ධ ඓතිහාසික කරුණු අනාවරණය ව... මූලාශ්‍ර (අ) තීරුවෙන් දක්වා ඇති අතර ඊට අදාළ තොරතුරු "ආ" තීරුවේ දැක්වේ. නිවැරදි අනුපිළිවෙලට ගැලපූ විට පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1. සමන්තපාසාදිකාව | A - ගම්නායකයින් තිදෙනෙකු සිදුකළ ලෙන් පූජාවක් |
| 2. පෙරියපුලියන්කුලම සෙල්ලිපිය | B - ගැමියෙකු ගම්කගෙන් වී මල්ලක් ණයට ඉල්ලා ගත් පුවතක් |
| 3. ජාතකට්ඨකතාව | C - ලෝහවැඩ කළ සුමනගේ පවුලේ ගෘහපතියෙකු කළ ලෙන් පූජා... |
| 4. කොරවක්ගල ලෙන්ලිපිය | D - ගම්කයන් ගෘහපතීන් අතරින්ම පත්වූ කෙනෙකු බව. |

   1. DCAB   2. CDBA   3. DCBA   4. BCAD

- පහත දී ඇති ප්‍රකාශ ඇසුරින් 12, 13 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  A - ප්‍රාදේශීය පාලකයින් හා සටන්කර ඒ ප්‍රදේශ අත්පත්කර ගනිමින් රජ බවට පත්වීම.
  B - ප්‍රථම සංවිධානාත්මක සටන් ව්‍යාපාරයට නායකත්වය දීම.
  C - විවාහ සබඳතාවලට එළඹීම මගින් විදේශ රටවල්වල දේශපාලන සහය ලබාගැනීමට කටයුතු කිරීම.
  D - දිවයිනේ ග්‍රාමසීමා සටහන් කිරීම.
  E - ප්‍රාදේශික පාලකයන් වූ පරුමකවරුන්ගේ සහය ලබාගෙන පාලන බලය මධ්‍යගත කිරීම.

12. ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් පණ්ඩුකාභය රජතුමා සම්බන්ධව තොරතුරු කියවෙන ප්‍රකාශ වන්නේ,
   1. AB හා D වේ.   2. A හා D පමණි.   3. ACE වේ.   4. A හා E පමණි.

13. දුටුගැමුණු රජතුමාට පමණක් අදාළ ප්‍රකාශ වන්නේ,
   1. A හා E පමණි.   2. ABC වේ.   3. B හා E පමණි.   4. BCE වේ.

14. නගරගුත්තික, පත අදෙක සහ මහමත යන නම් වලින් අතීත සෙල්ලිපිවල සඳහන් කර තිබූ නිලධාරීන් පිළිවෙලින් දැක්වූ විට නිවැරදි පිළිතුර වන්නේ,
   1. නාගරික වාස්තු ශිල්පී, වෙළඳ කටයුතු භාර ප්‍රධානී, මහරජ
   2. නගර පරිපාලක, වෙළඳ කටයුතු භාර ප්‍රධානී, මහ ඇමති
   3. නගර පරිපාලක, කාසි අච්චු ගැසීමේ ප්‍රධානී, මහ ඇමති
   4. නගර ආරක්ෂක, වෙළඳ කටයුතු භාර ප්‍රධානී, මහරජ



Scanned with CamScanner

15. අතීත රජවරුන්ගේ ස්වරූප අනුව ගොඩනැගුණු රාජ්‍යත්ව සංකල්පවලට අදාළ වන රජවරුන් නිවැරදිව ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| රාජ්‍යත්ව සංකල්ප | රජු |
| 1. දේවත්ව | A - නිශ්ශංකමල්ල |
| 2. බෝධිසත්ව | B - සිරිසඟබෝ |
| 3. පර්වත රාජ | C - මහසෙන් |
| 4. චක්‍රවර්ති | D - පළුවන කාශ්‍යප |

1. CABD 2. BCAD 3. DABC 4. CBDA

16. වැව් ප්‍රපතනය හා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
1. සමීපව තිබෙන වැව් ඇළ මාර්ග මගින් සම්බන්ධ කිරීම සිදුවේ.
2. භූමියේ තෙතමනය රඳවා ගැනීමෙන් බෝග වගාව පහසු කරගැනීමට උපකාර වේ.
3. මහා පරිමාණ තනි වැව් ඉදිරිකිරීමෙන් ගංවතුර පාලනය කිරීම සිදුවේ.
4. ඉහළින් පිහිටි වැව්වල අතිරික්ත ජලය පහළ වැව්වලට හරවා ජලසංරක්ෂණය සිදුකෙරේ.

17. සහෝදරයාගෙන් සහෝදරයාට රජකම හිමිවීමේ අවස්ථාවක් වන්නේ,
1. කාවන්තිස්ස රජුගෙන් පසු දුටුගැමුණු රජු.
2. පණ්ඩුකාභය රජුගෙන් පසු මුටසීව රජු
3. දේවානම්පියතිස්ස රජුගෙන් පසු උත්තිය රජු
4. කුඨකණ්ණ තිස්ස රජුගෙන් පසු භාතිකාභය රජු

18. අන්තර්ජාතික කටයුතු නිසා සරු ආදායමක් උපදවන ලද මාතොට වරායේ සියලුම ආදායම් ලබමින් අනුරාධපුරය පාලන කරන ලද සොළී රජු වන්නේ,
1. කාලිංග මාඝ 2. එළාර 3. චන්ද්‍රභානු 4. විජයකුලංකෙ

| "අ" | "ආ" |
|---|---|
| 1. දකුණු ඉන්දියාවේ පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයට සහභාගිවීම. | A - 1 වන විජයබාහු |
| 2. විසිවතාවක් චීනයට දූතයන් පිටත් කර හැරීම | B - 4 වන කාශ්‍යප |
| 3. දළදා මාලිගාවේ ආරක්ෂාවට වේලෙක්කාර හමුදාව පත්කිරීම. | C - 6 වන අග්ගබෝධි |
| 4. පැතිර ගිය දරුණු උණ රෝගයක් සඳහා විශේෂ රෝහලක් ඉදිකිරීම. | D – 1වන ගජබාහු |

19. ඉහත "අ" තීරුවේ දක්වා ඇති විස්තරයට අදාළව "ආ" තීරුවේ රජුන්ගේ නම් නිවැරදිව ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,
1. DCAB 2. CDAB 3. DABC 4. BACD

20. "රතුකැට දිවයිනේ" රජු ඉස්ලාමීය රජු සමඟ තෑගි බෝග හුවමාරුකරගත් බව සඳහන් කරන ලද අරාබි ජාතික ඉතිහාසඥයා වන්නේ,
1. අල්බලසූරි 2. ඉබන්බතුතා 3. සුලෙයිමාන් 4. ඉබ්න් ශහ්රියර්



Scanned with CamScanner

21. "අභසින් වැටෙන එක දිය බිඳක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යාමට ඉඩ නොදිය යුතුය" යන ප්‍රකාශය කරනු ලැබූ රජු වන්නේ,
1. මහසෙන් රජුය.
2. 1 වන පරාක්‍රමබාහු රජුය.
3. 6 වන පරාක්‍රමබාහු රජුය.
4. වසභ රජුය.

| "අ" | "ආ" |
|---|---|
| පැරණි කර්මාන්ත ශිල්පීන් | සෙල්ලිපි මූලාශ්‍රය |
| 1. කබර | A - හම්බන්තොට වෙහෙරකෙම සෙල්ලිපිය |
| 2. තුලදර | B - මහනුවර වේගිරිය සෙල්ලිපිය |
| 3. දටික | C - පොලොන්නරුව මුතුගල්ල සෙල්ලිපිය |
| 4. තතවය | D - මාතලේ ඇඹුල් අඹේ සෙල්ලිපිය |
| | E - හම්බන්තොට මණ්ඩගල සෙල්ලිපිය |

22. පැරණි ලංකාවේ පැවති කර්මාන්ත පිළිබඳ තොරතුරු සෙල්ලිපි මූලාශ්‍ර අධ්‍යයනයෙන් හෙළිවේ. ඉහත වගුවේ "අ" තීරුව හා "ආ" තීරුව ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,
1. CBAD
2. CEDA
3. CEBA
4. CEAB

23. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරනු ලැබුවේ කුමන රජුගේ රාජ්‍ය කාලයේදී ද?
1. දුටුගැමුණු රජු
2. මහසෙන් රජු
3. වළගම්බා රජු
4. කාවන්තිස්ස රජු

24. ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ රැගෙන හේමමාලා කුමරිය සහ දන්ත කුමරු ගොඩබසින ලද ස්ථානය ලෙස හඳුනාගෙන ඇත්තේ,
1. සූකරතිත්ථයි
2. ජම්බුකෝල පට්ටනයි
3. ගෝකණ්ණතිත්ථයි
4. ලංකාපට්ටනයි

25. ධර්මය කොටස් වශයෙන් කටපාඩමින් මතක තබාගත් භික්ෂූන් වහන්සේලා හඳුන්වනු ලැබුවේ,
1. භාණකවරුන් නමිනි.
2. සද්ධිවිහාරික නමිනි.
3. අන්තේවාසික නමිනි.
4. ථෙර යන නමිනි.

26. "ජීවිතය ලැව් ගින්නකට හසු වූ වරා මලක් සේ අස්ථිරයි" දැක්වෙන සිත්ගන්නා සුලු කවියක් සටහන්ව ඇති මූලාශ්‍රය වන්නේ,
1. සීගිරි කැටපත් පවුර
2. අනුරාධපුර අභයගිරි සෙල්ලිපිය
3. කිරින්ද විහාර සෙල්ලිපිය
4. කුරුණෑගල හැලඹගල සෙල්ලිපිය

27. අතීත ලංකාවේ වියළි කලාපයේ ජනතාව මුහුණ දුන් ප්‍රබලතම අභියෝගය වූයේ,
1. නිරන්තර සිදු වූ විදේශ ආක්‍රමණන්ගෙන් ජීවිත ආරක්ෂා කරගැනීම.
2. කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ගොඩබිම් නොමැති වීම.
3. ස්වභාවධර්මයෙන් සිදුවන අනතුරුවලට මුහුණ දීම.
4. ගොවිතැන් සහ දෛනික අවශ්‍යතාවලට ප්‍රමාණවත් තරම් ජලය නොමැති වීම.

- පැරණි වාරි තාක්ෂණයේ විශිෂ්ටත්වය වඩාත් හොඳින් ප්‍රකට කරමින් ඒවා ඉදිකළ රජවරුන්ගේ සේවය අදටත් අමරණී වේ. පහත වගුවෙන් රජවරුන්ගේ නම්, ඉදිකළ වැව් සහ ඇළමාර්ග දැක්වේ.

| රජු | වැව | ඇළමාර්ග |
|---|---|---|
| A - වසභ රජු | D - පරාක්‍රම සමුද්‍රය | G - අංගමැඩිල්ල ඇළ |
| B - ධාතුසේන රජු | E - මහවිලච්චිය වැව | H - යෝධ ඇළ |
| C – 1 වන පරාක්‍රමබාහු රජු | F - කලා වැව | J - ඇළහැර ඇළ |

28. රජු ඉදි කළ වැව් සහ ඇළමාර්ග ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,
1. AEJ 2. BDH 3. CFG 4. BFJ

29. සොරොව්වකින් වාරි ඇළ මාර්ග වලට ජලය මුදා හැරීම සඳහා සිරස් අතට සොරොව්වට සම්බන්ධකර තිබූ ගල් කුළුණ හැඳින් වූ නම වන්නේ,
1. ඉස්වැටි 2. දියකැට පහණ 3. අවරණ 4. පිටවාන

30. වැව් බැම්ම නිර්මාණයේදී ශක්තිමත්බව හා ස්ථායිතාව ආරක්ෂා කිරීමට පස් තට්ටු කිහිපයක් යොදා සකස් කරගත් බවට සාක්ෂි සාධක දක්නට ලැබෙන්නේ කුමන වැවක් ආශ්‍රිතවද?
1. පරාක්‍රම සමුද්‍රය 2. කලා වැව 3. යෝධ වැව 4. සීගිරි මහවැව

31. පැරණි වැවක අන්තර්ගත කොටස් "අ" තීරුවේත් ඒවායේ කාර්යයන් "ආ" තීරුවේත් දක්වා ඇත. මේ තීරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1. වැව් බැම්ම | A - වැවෙහි ජලය අවම පීඩනකින් මුදාහැරීම |
| 2. සොරොව්ව | B - ජල තරංගවලින් වැව්බැම්ම ඛාදනය වැලැක්වීම |
| 3. බිසෝ කොටුව | C - වාරි ජලය ඇළමාර්ගවලට මුදා හැරීම |
| 4. රළපනාව | D - වැවේ ජල ධාරිතාව ආරක්ෂිතව රඳවා ගැනීම. |

1. DACB 2. CABD 3. DCAB 4. DBAC

32. ආලාහන පිරිවෙන් රෝහල් නටබුන් අතරින් අනාවරණය වූ කරුණක් නොවන්නේ,
1. ජලයේ නියමිත ප්‍රමිතිය හා සිසිලනය ආරක්ෂා වන ලෙස සාදන ලද ළිංවල සාධක හමුවීම
2. සැත්කම් සඳහා භාවිතා කරන ලද සංකීර්ණ ශල්‍ය උපකරණ හමුවීම.
3. ගොඩනැගිලි ප්‍රමාණයට ගැළපෙන පරිදි වැසිකිළි ඉදිකර තිබීම.
4. 1 වන පරාක්‍රමබාහු රජුගේ කාලයේ පටන් ක්‍රියාත්මක වූ බවට සාධක හමු වීම.

33. අතීතයේ අවකාශය, බර සහ කාලය මැනීම සඳහා භාවිතා කරනු ලැබූ මිනුම් පිළිවෙලින් ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,
1. ධරණ, අමුණ, හවජර
2. කිරිය, ධරණ, තිපීය
3. ධරණ, කිරිය, වීහ
4. කිරිය, හවජර, අක

34. සිතුල්පව්ව ප්‍රදේශයේ පැවති විනිශ්චය ශාලාවේ දඩ මුදල් සිතුල්පව්ව විහාරයේ වැඩවාසය කරන භික්ෂූන් වහන්සේලාගේ සිව්පසය වෙනුවෙන් පූජාකළ රජුවන්නේ,
1. IV වන උදය රජු
2. අමණ්ඩ ගාමිණී අභය රජු
3. I වන ගජබාහු රජු
4. IV මිහිඳු රජු

35. අතීත ජනයා අනුභව කළ "යවාගු" ලෙස හඳුන්වන ලද ආහාරය
1. ප්‍රභූන් සඳහා සැකසූ ආහාරයකි.
2. භික්ෂූන්වහන්සේලාට ලබාදුන් අතුරුපසකි.
3. රෝගීන්ට ලබාදුන් ආහාරයකි.
4. කිරිවලින් සකස් කරන ලද ආහාරයකි.

36. "මාගේ දුවණියට කිරි කන්නට හරක් බානකුත් දුනමනා වේදැයි" යනුවෙන් පියකු අසන ආකාරය සඳහන් සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ,
1. ධම්පියා අටුවා ගැටපදය
2. සද්ධර්මරත්නාවලිය
3. බුත්සරණ
4. පූජාවලිය



Past Papers Wiki
Scanned with CamScanner

37. අතීතයේ "ගෘහදණ්ඩ" බද්ද යනුවෙන් හැඳින්වූයේ කුමන කාරණයට අයකරන ලද්දක් ද?
   1. ගමේ ජීවත් වූ ජනයා භූමිය පරිහරණය කිරීම වෙනුවෙන් රජයට ගෙවිය යුතු බද්ද
   2. ගම්වල ගෘහමූලිකයෙකු වරදක් සිදු කළ විට ගම්නායකයාට ගෙවිය යුතු බද්ද
   3. සැඟවුණු අපරාධකරු අල්ලා ගන්නාතුරු ගමේ වැසියන් රජයට ගෙවිය යුතු බද්ද
   4. නිවාසවල සොරකම් සම්බන්ධයෙන් රජය විසින් වැරදිකරුවන්ගෙන් අය කළ බද්ද

38. "මෛකාප්පර් යනුවෙන් අතීතයේ හඳුන්වනු ලැබුවේ,
   1. ආරක්ෂක නිලධාරියා
   2. සේනාපති
   3. බදු අයකළ නිලධාරියා
   4. අධිකරණ නිලධාරියා

39. අග්නිදිග අසියාතික වාස්තුවිද්‍යා ලක්ෂණ වඩාත් හොඳින් ප්‍රකට වන ස්ථානකි.
   1. පොළොන්නරුවේ සත්මහල් ප්‍රාසාදය
   2. ගඩලාදෙනි විහාරය
   2. අනුරාධපුර ලෝවාමහාපාය
   4. මහනුවර ලංකාතිලක පිළිමගෙය

40. ශ්‍රී ලංකාවේ පළමුවන නාගරීකරණය පිළිබිඹුවන පැරණි නගර වූයේ,
   1. මාගම සහ ගෝණකණ්ණ
   2. අනුරාධපුරය සහ නාගදීපය
   3. මාගම සහ දඹදෙනිය
   4. අනුරාධපුරය සහ මාගම

Scanned with CamScanner

සියලුම හිමිකම් ඇවිරිණිAll Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

| 33 | S | II |
|---|---|---|

## Grade 10 – Second Term Test – October 2023

කාලය : පැය 3
Time: 3 hours

දෙවන වාර පරීක්ෂණය – ඔක්තෝබර් (2023) - 10 ශ්‍රේණිය

## ඉතිහාසය – II

Name: - ............................................................ class: -.................. Index no: - ........................

සැලකිය යුතුයි.

- පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 6කි.

1.

(අ)

පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමෙහි ද ලකුණු කර නම් කරන්න.

i. කලාවැව, ගෝකණ්ණ, මාගම, රංචමඩම, රාවණාඇල්ල, හුරුලු වැව, පොළොන්නරුව, මැණික් ගඟ, තිරුකේතීශ්වරම්, ඉබ්බන්කටුව, කැළණිය, කාලතිත්ථ

(ලකුණු 12යි)

ii. චීනය, රෝමය, රතු මුහුද, බ්‍රිතාන්‍යය, අරාබිය, මලය අර්ධද්වීපය

(ලකුණු 6යි)

(ආ)

i. පහත A,B,C,D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු වලට සම්බන්ධ පුද්ගයින් හෝ ස්ථාන නම් කරන්න.

A - වසභ රජුගේ ඇවෑමෙන් ඊළඟට රාජ්‍යත්වයට පත්වූ රජු
B - තිස්සමහාරාම වැව ඉදිකළ රජු
C - ජේතවනාරාම චෛත්‍යය ඉදිකරන ලද රජු
D - පළමු වන පරාක්‍රමබාහු රජු උපත ලද ස්ථානය හැඳින්වූ ඉපැරණි නාමය

(ලකුණු 4යි)

ii. A සහ B වශයෙන් දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A රූපය

(i) මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?
(ii) එය පිහිටා ඇති පළාත නම් කරන්න.
(iii) මෙමගින් සිදුකර ඇති කාර්යය කුමක්ද?
(iv) එය අයත් වන්නේ කුමන කාල වකවානුවකටද? (ලකුණු 4යි)



(i) මෙම පින්තූරයේ දැක්වෙන්නේ කාගේ පිළිරුවක්ද?

(ii) මෙම පිළිරුව දක්නට ලැබෙන්නේ කුමන ස්ථානයකද?

(iii) එතුමා විසින් සිදුකරනු ලැබූ විශේෂ කාර්යය කුමක්ද?

(iv) එතුමාගේ කාලයේදී ලාංකික දූතයෙකු යවනු ලැබුවේ කුමන රටකටද?

(ලකුණු 4යි)

B රූපය

## II කොටස

2.

i. මහා වංශය රචනා කිරීමේදී ආභාසය ලබාගත් මුල් ග්‍රන්ථ 3ක් නම් කරන්න.

(ලකුණු 3යි)

ii. ක්‍රි.ව.දෙවන සියවසෙන් පසු ශිලා ලේඛන පිහිටවනු ලැබුවේ කුමන කරුණු වාර්තා කර තැබීමටද? ඉන් 4ක් ලියා දක්වන්න.

(ලකුණු 4යි)

iii. ඉතිහාසය හැදෑරීමේදී කාසි වැදගත් මූලාශ්‍රයක් වන අයුරු කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 5යි)

iv. ඉතිහාසය අධ්‍යයනය කිරීම ප්‍රයෝජනවත් වන්නේ ඇයි දැයි කරුණු 3ක් යටතේ පැහැදිලි කරන්න.

(ලකුණු 6යි)

3.

i. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන 3ක් නම් කරන්න.

(ලකුණු 3යි)

ii. ගල් යුගයේ ආදි මානවයා ජීවත් වූ ප්‍රධාන පරිසර කලාප 4ක් නම් කරන්න.

(ලකුණු 4යි)

iii. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ආහාර රටාව තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ 2ක් ලියා පැහැදිලි කරන්න.

(ලකුණු 5යි)

iv. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ ප්‍රධාන සාධක 3ක් ලියා විස්තර කරන්න.

(ලකුණු 6යි)

4.

i. මුල් ඓතිහාසික යුගයේ කාර්යයන් පදනම් කරගනිමින් ක්‍රියාත්මක වූ ගම් වර්ග 3ක් නම් කරන්න.

(ලකුණු 3යි)

ii. පැරණි ජනයා හේන් ගොවිතැන යටතේ වගා කරනු ලැබූ කටුසර බෝග 4ක් නම් කරන්න.

(ලකුණු 4යි)



PAST PAPERS WIKI

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Scanned with CamScanner

iii. පූර්ව ඓතිහාසික යුගයේ ජනයාගේ ජීවන රටාවේ දක්නට ලැබෙන විශේෂතා කරුණු 2ක් යටතේ විස්තර කරන්න.

(ලකුණු 5යි)

iv. පූර්ව ඓතිහාසික මානවයා මියගිය අය වෙනුවෙන් ඉදිකළ සොහොන් ආකාර කිහිපයකි. නිදසුන් 3ක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 6යි)

5.

i. A - ශෙනපති B - නව අදෙක C - කනපෙඩික

ඉහත නම් වලින් හඳුන්වනු ලැබූ අතීත නිලධාරීන් නම් කරන්න.

(ලකුණු 3යි)

ii. පංච කකුධ භාණ්ඩවලට අයත් වර්ග 4ක් ලියා දක්වන්න.

(ලකුණු 4යි)

iii. රජවරුන්ගේ ක්‍රියාකලාපය සහ පෙනී සිටි ආකාරය අනුව රාජාත්ව සංකල්ප ගොඩනැගී ඇත. එබඳු සංකල්ප 2ක් නිදසුන් සමගින් පැහැදිලි කරන්න.

(ලකුණු 5යි)

iv. මෙරට රජ කළ රජවරුන් අතර වසභ රජුට සුවිශේෂී ස්ථානයක් හිමිවේ. එතුමාගේ සේවය කරුණු 3ක් යටතේ පැහැදිලි කරන්න.

(ලකුණු 6යි)

6.

i. සෙල්ලිපි මගින් අනාවරණය වන කරුණු අනුව අතීතයේ පාලනය මෙහෙයවූ පහත නම්වලින් හඳුන්වනු ලැබූ ආයතන හා පුද්ගලයින් නම් කරන්න.

A - සභාව B - වත්හිමි C - මහලේ (ලකුණු 3යි)

ii. ක්‍රි.ව. 9වන සියවසේ රචනා කරන ලද සෙල්ලිපියක සඳහන් පහත සංකේත මගින් ඇඟවෙන අර්ථ ලියා දක්වන්න.

A - වටාපත B - අඩසඳ C - වැල D - කපුටා සහ බල්ලා

(ලකුණු 4යි)

iii. අතීත සමාජයේ වෙළඳාම පැවති ආකාරය ඓතිහාසික මූලාශ්‍ර මගින් සනාථ වේ. නිදසුන් 2කින් පැහැදිලි කරන්න.

(ලකුණු 5යි)

iv. පැරණි සමාජයේ වාර්ගික සහජීවනය කරුණු 3ක් යටතේ පැහැදිලි කරන්න.

(ලකුණු 6යි)

7.

i. ඇළහැර ඇළ මගින් පෝෂණය වූ වැව් තුනක් නම් කරන්න.

(ලකුණු 3යි)

ii. බෞද්ධ විහාරාරාමවල විසූ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා ඉදිකරන ලද පොකුණු 4ක් නම් කරන්න. (ලකුණු 4යි)

iii. ශ්‍රී ලංකාවේ යකඩ නිස්සාරණය කිරීමේ පැරණි තාක්ෂණයේ ස්වභාවය නිදසුන් දෙකක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 5යි)

iv. පූර්ව ඓතිහාසික යුගයේ පැවති විද්‍යාත්මක අදහස්වල ස්වරූපය පිළිඹිබු වන අවස්ථා 3ක් පැහැදිලි කරන්න. (ලකුණු 6යි)



Past Papers Wiki

Scanned with CamScanner

8.

i. පැරණි සමාජයේ ක්‍රියාත්මක වූ බදු නීතිය යටතේ පැවතියා වූ ප්‍රධාන බදු වර්ග තුනකි. ඒවා නම් කරන්න. (ලකුණු 3යි)

ii. ඓතිහාසික යුගයේ සමාජ ධුරාවලියේ සාමාන්‍ය ජනතාව අතර සිටි පුද්ගල කණ්ඩායම් 4ක් නම් කරන්න. (ලකුණු 4යි)

iii. පැරණි සමාජයේ ශ්‍රී ලංකාවේ කාන්තාව ගැන ගෞරවනීය සහ උසස් අන්දමින් සැලකූ ආකාරය කරුණු 2ක් යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 4යි)

iv. අතීත සමාජයේ පරිසරය ආරක්ෂා කරගැනීමේ වැදගත්කම පිළිබඳව නීතිරීති පැනවූ ආකාරය නිදසුන් තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6යි)

9.

i. පොළොන්නරුව රාජධානිය පාලනය කළ කැපී පෙනෙන ශ්‍රේෂ්ඨ රජවරුන් තිදෙනෙක් නම් කරන්න.

(ලකුණු 3යි)

ii. ඓතිහාසික යුගයේ පුර යන සංකල්පය තුළ නගරයක ඇතුලත් විය යුතු යැයි සැලකූ ප්‍රධාන අංග 4ක් ලියා දක්වන්න.

(ලකුණු 3යි)

iii. පළමුවන විජයබාහු රජුගේ විශිෂ්ටත්වය කරුණු 2ක් යටතේ විස්තර කරන්න.

(ලකුණු 3යි)

iv. පොළොන්නරුව රාජධානිය බිඳ වැටීමට තුඩුදුන් හේතු 3ක් නිදර්ශන සමඟින් පැහැදිලි කරන්න. (ලකුණු 6යි)

Scanned with CamScanner

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න